# බැඳීම #4

| සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා පුරවැසි සහභාගීත්වයෙන් යුතු තිරසර ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම | | | |
|---|---|---|---|
| 2019 මාර්තු 01 – 2021 අගෝස්තු 31 | | | |
| ක්‍රියාත්මක කිරීමේ දී මූලික වන ආයතනය/ පුද්ගලයා | සෞඛ්‍යය විෂය භාර අමාත්‍යාංශය | | |
| **බැඳීම පිළිබඳ විස්තරය** | | | |
| බැඳීම මගින් අවධානයට ලක්කරන්නා වූ මහජන ගැටළුව කුමක්ද? | ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම සඳහා සෞඛ්‍ය ක්ෂේත්‍රය තුල වර්තමානයේ ප්‍රතිසංස්කරණයන් සිදුවෙමින් පවතී. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අවශ්‍යතා සහ පුරවැසියන්ට ආසන්නතම ප්‍රාථමික සෞඛ්‍ය සේවා රෝහල වෙත ගොස් උචිත විශේෂඥ සේවාවන් ලබා ගැනීම මෙම ප්‍රතිසංස්කරණයන් මගින් අරමුණු කෙරේ. මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ සාර්ථකත්වයට පුරවැසියන් සහභාගි වීම වැදගත් වුවද වර්තමානයේ දී සෞඛ්‍ය ක්ෂේත්‍රය සංවර්ධනය සඳහා පුරවැසි සහභාගීත්වය අඩු මට්ටමක පවතී. එයට මූලික හේතුවක් වන්නේ තොරතුරු හුවමාරු කරගැනීම සහ ඒ අනුව පුරවැසියන්ගේ අදහස් ලබා ගැනීම සඳහා තිරසර ක්‍රමවේදයන් නොමැති වීමය. | | |
| බැඳීම කුමක්ද? | සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ සාර්ථක වීම සඳහා පුරවැසියන්ගේ අවබෝධය හා සහභාගීත්වය තිබිය යුතුය. පුරවැසියන් බලාත්මක කර රට තුළ සෞඛ්‍ය සේවා සැපයීම සංවර්ධනය කිරීම සඳහා ඔවුන්ගේ සහභාගීත්වය ඇති කිරීමට ක්‍රමෝපායන් ඇති කිරීම මෙම බැඳීමෙහි අරමුණ වේ. මෙම කාර්ය පහසු කරලීම සඳහා පුරවැසියන් හට සහභාගීවීම සඳහා දැනට පවතින මාර්ගයන් නැවත විමසීමකට ලක් කළ යුතුය. පුරවැසියන්ගේ සහභාගීත්වය සහ තොරතුරු බෙදාගැනීම සඳහා පවතින වේදිකාවන් අතර විධිමත් සබඳතාවයන් ශක්තිමත් කෙරෙනු ඇත. | | |
| මෙම මහජන ගැටළුව විසඳීම සඳහා හඳුනාගත් බැඳීම දායක වන්නේ කෙසේද? | සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සංවර්ධනයේ දී පුරවැසියන් සහභාගිවීම සඳහා ඔවුන් බලාත්මක කිරිමට ක්‍රමෝපායන් කිහිපයක් භාවිතා කෙරෙනු ඇත. පුරවැසි සහභාගීත්වය විධිමත් කිරීමට පුරවැසි සංවිධාන සමඟ මීට වඩා වැඩි සබඳතාවයන් ස්ථාපිත කෙරෙනු ඇත. සෞඛ්‍ය අමාත්‍යාංශ වෙබ් අඩවිය පුරවැසි මිත්‍රශීලී කිරීම තුලින් පුරවැසියන්ට තොරතුරු වඩා පහසුවෙන් ලබා ගැනීමට හා ඔවුන්ගේ අදහස් දැක්වීම සඳහා අවස්ථාවන් සැකසෙනු ඇත. මෙම වේදිකාව තුල පුරවැසියන්ගේ සෞඛ්‍යයට අහිතකර වන්නා වූ ඇතැම් මතිමතාන්තර ඉවත් කලහැකි, වටහා ගැනීමට පහසු සාක්ෂි මත පදනම් වූ සෞඛ්‍ය තොරතුරු සැපයීම මගින් සෞඛ්‍ය සාක්ෂරතාවය වර්ධනය කිරීමට දායකත්වය ලබා දෙයි. ප්‍රමුඛ අංශ ලෙස නිදන්ගත වකුගඩු රෝග, මානසික සෞඛ්‍යය හා ඖෂධ සැපයීම කළමනාකරණය හඳුනාගෙන ඇත. පුරවැසියන්ට සිය අදහස් දැක්වීමට සම්පූර්ණ අවස්ථාවන් ඇති අතර, ඔවුන්ගේ සෞඛ්‍යාරක්ෂණ පුරුදු වෙනස් කර ගැනීම සඳහා ඔවුන් බලගැන්වීම ද සිදුකළ යුතුය. එනම්, ප්‍රාථමික සත්කාරයන් ශක්තිමත් කිරීම තුලින් ප්‍රාථමික සත්කාරයන් සඳහා පුරවැසියන්ගේ පළමු තේරීම ඔවුන්ට ආසන්නතම රෝහල බවට පත් කිරීම සිදුකළ යුතුය. | | |
| මෙම බැඳීම විවෘත රාජ්‍ය හවුල්කාරීත්ව අගයන්ට අදාළ වන්නේ ඇයි? | සෞඛ්‍ය ප්‍රතිසංස්කරණයන් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට පුරවැසියන්ගේ සහභාගීත්වය දිරිගැන්වීමක් සිදුවන බැවින් මෙම බැඳීම මගින් **මහජන සහභාගීත්වය** යන ප්‍රතිපත්තිය වර්ධනය වේ. **තොරතුරු සඳහා ප්‍රවේශය** යන කාරණාව පුරවැසියන්ට සෞඛ්‍ය පිළිබඳ තොරතුරු වෙත වඩා හොඳින් ප්‍රවේශ වීම තුලින් සහතික වෙයි. | | |
| අමතර විස්තර | මෙම ප්‍රතිසංස්කරණයන් විශ්ව සෞඛ්‍ය සත්කාරය යටතේ සෞඛ්‍ය සේවාවන් සැපයීමේ ප්‍රතිපත්තිය ලෙස අනුමත කර ඇත. | | |
| බැඳීම සපුරාලීම සඳහා ඉලක්කගත ක්‍රියාකාරකම් | | ආරම්භක දිනය | අවසන් දිනය |
| 1. සර්වෝදය සහ Peoples' Health Movement යනා දී සංවිධාන ජාලයන් හරහා සෞඛ්‍ය ප්‍රවර්ධනයට පුරවැසියන්ගේ සහභාගීත්වය ඇති කිරීම සඳහා තිරසර ක්‍රමවේදයන් හඳුන්වා දීම | | 2019 අප්‍රේල් | 2020 පෙබරවාරි |

| | | |
|---|---|---|
| 2. පුරවැසි හා වෘත්තික මිත්‍රශීලී අමාත්‍යාංශ වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සහ ඒ මගින් ආයතනයේ ප්‍රතිරූපය ගොඩනැගීම සිදුවන අතරම සෞඛ්‍ය සංවර්ධනය සඳහා සියළු දෙනාගේ සහභාගීත්වය ලබාගනු ඇත. | 2019 අප්‍රේල් | 2020 ජූනි |
| 3. ප්‍රාථමික සත්කාර මට්ටම දක්වා ඖෂධ සැපයීම් කළමනාකරණ තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීම සහ එමගින් සපයන්නන් සහ පුරවැසියන් සඳහා තොග සම්බන්ධ තොරතුරු ලබා දීම. | 2019 අප්‍රේල් | 2020 ජූනි |
| 4. විධිමත් සන්නිවේදන ක්‍රමෝපායන් හරහා නිධන්ගත වකුගඩු රෝගවලට අදාළව සිදුකර ඇති ආහාර පදනම් පර්යේෂණ තොරතුරු පුරවැසියන්ට ලබා දීම | 2019 අප්‍රේල් | 2020 පෙබරවාරි |
| 5. පාසල්වල සහ අනෙකුත් සමාජ ආයතනවල මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා සාක්ෂි මත පදනම් වූ සන්නිවේදන ප්‍රචාරණයන් දියත් කිරීම | 2019 ජූලි | 2020 ජූනි |

| **සම්බන්ධීකරණ තොරතුරු** | | |
|---|---|---|
| ක්‍රියාත්මක කරන ආයතනයෙන් වගකිව යුතු පුද්ගලයාගේ නම | | විශේෂඥ වෛද්‍ය එච් එස් ආර් පෙරේරා මහත්මිය |
| තනතුර දෙපාර්තමේන්තුව , | | අධ්‍යක්ෂ (සංවිධාන සංවර්ධන), සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය |
| විද්‍යුත් තැපැල් ලිපිනය සහ දුරකථන අංකය | | විද්‍යුත් තැපැල : susiepds@gmail.com<br>ජංගම දුරකථනය : 0777588944 |
| සම්බන්ධවන අනෙකුත් පාර්ශවයන් | රාජ්‍ය අංශයෙන් සම්බන්ධවන පාර්ශවයන් | *සෞඛ්‍ය දෙපාර්තමේන්තුව* |
| | සිවිල් සමාජයීය සංවිධානපුද්ගලික , ,අංශයබහුපාර්ශවීය අංශ හා අනෙකුත් ක්‍රියාකාරී කම්ටු | සර්වෝදය, *Peoples' Health Movement* |